කුරුවිට තරුණිය ඝාතනය හා දිවි අහිමි කරගැනීමේ සිදුවීම සියලුම මාධ්‍ය ඔස්සේ පාහේ ප්‍රචාරය වී තිබුණි. මෙම සිදුවීම වාර්තා කළ මුද්‍රිත හා රූපවාහිනී මාධ්‍ය බොහෝමයක එම ඝාතනය වූ තරුණියගේ ඡායාරූප පළවී තිබිණි. සිරස ටීවී පුවත් තුළ තරුණියගේ ඡායාරූපය දැක්වී තිබුණද, එය හඳුනාගත නොහැකි අයුරින් බොඳ කොට තිබිණි. ඡායාරූපය පළ නොකර ප්‍රවෘත්තිය ඉදිරිපත් කිරීමට ප්‍රවේසම් වී තිබුණේ අද, ඩේලි නිව්ස් සහ සිලෝන් ටුඩේ පමණි.

1) මෙම සිදුවීමේ ස්වභාවයත්, ඊට ලැබුණු පුළුල් අවධානයත් සමගින් බැලූ විට, මෙම ඡායාරූපයන් පළ කිරීම ඔස්සේ මියගිය අයට අගෞරවයක් සිදුනොවන්නේද?
2) එසේම මියගිය අයවලුන්ගේ පවුලේ අයට අනවශ්‍ය සිත්වේදනාවන් ඇති නොවන්නේද?
3) එසේම, මෙම සිදුවීම භාවාතිෂය ආකාරයකින් ඉදිරිපත් වීමටද එම ඡායාරූප පළ කිරීම තුඩු නොදෙන්නේද?
4) ඒ අනුව සමස්තයක් ලෙසින් ගත් විට, මියගිය අයගේ ඡායාරූප පළ කිරීම මාධ්‍ය ආචාර ධර්මයන් උල්ලංඝනය නොකරන්නේද?

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #EnglishNews #Lankadeepa #Mawbima #Divaina #Dinamina #Aruna #CeylonToday #DailyNews #DailyMirror #TVDerana #HiruTV #SirasaTV #Swarnavahini #ITN #Rupavahini #TVNews